# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2450/42 - 2025 අගෝස්තු මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2025.08.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 සහ 33 වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියමය

2024.05.29 දිනැති හා අංක 2386/08 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනය මෙයින් සංශෝධනය කරමි.

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය සුනිල් කුමාර ගමගේ වන මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සහ සංශෝධන අනුව 32 සහ 33 වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් ක්‍රීඩාවන් සඳහා වන ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයන්හි ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවන අතර තාවකාලික කාර්ය ක්‍රමයක් වශයෙන් එකී ජාතික ක්‍රීඩා සම්මේලනයන්හි පරිපාලනය හා වෙනත් යම් අවැසි කටයුතු යථායෝග්‍ය අයුරින් ඉටුකිරීම උදෙසා සහ අදාළ නිළවරණයන් කැඳවීමට හා පැවැත්වීමටත් 2025 අගෝස්තු මස 19 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා නිසි බලධාරියා ලෙස මෙයින් පත් කරමි.

01. ශ්‍රී ලංකා පාපැදි සම්මේලනය
02. ශ්‍රී ලංකා මෝටර්රථ සම්මේලනය
03. ශ්‍රී ලංකා දැල්පන්දු සම්මේලනය

**සුනිල් කුමාර ගමගේ** (පා.ම),
තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය.

2025 අගෝස්තු මස 19 වැනි දින.
කොළඹ දී ය.

EOG 08 - 0237


1A - G 45201 — 05 (2025/08)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*